අවශ්‍යතාවයක් තිබෙනවා.

තමන්ගේ සේවා ස්ථානයේ දී හෝ පෞද්ගලික අංශයේ රැකියාවක් කරද්දී ඕනෑ තරම් අයිතිවාසිකම් උල්ලංඝණය විය හැකියි. හැබැයි මේ හැම ක්ෂේත්‍රයක්ම ආවරණය කරන්නට මූලික අයිතිවාසිකම් ක්‍රියාත්මක කිරීමේදි ප්‍රායෝගික ගැටළු මතුවනවා. නමුත් ජනතාවගේ මූලික අයිතිවාසිකම් ස්ථාපනය කිරිම මීට වඩා පුළුල් කිරීම සඳහා ජාත්‍යන්තරයේ ක්‍රියාත්මක වන ආණ්ඩුක්‍රම මූලධර්මයන් මත මූලික අයිතිවාසිකම් පුළුල් කිරීමේ අවශ්‍යතාවක් මතුවී තිබෙනවා. තවත් මූලික ගැටළුවක් තමයි අපේ මූලික අයිතිවාසිකම් උල්ලලංඝණය වූ විට මාසයක කාලයක් තුළ අධිකරණමය ක්‍රියාමාර්ගයකට අපි යා යුතුයි. යම්කිසි විධියකින් රාජ්‍ය ආයතනයක හෝ තමන්ගේ සේවා ස්ථානයක සේවකයෙකුගේ අයිතිවාසිකම් උල්ලංඝණය වුනාම එම සේවා ස්ථානයේම අභ්‍යන්තරයේ ගත යුතු ක්‍රියාමාර්ග තියෙනවා. ප්‍රායෝගිකව ඒ ක්‍රියාමාර්ගවලට යොමුවීම අත්‍යවශ්‍යයි. එහිදි ප්‍රායෝගිකව අර කියූ මාසයක කාලසීමාව ගෙවී යනවා. එහිදි මූලික අයිතිවාසිකම් ගොණු කිරීමට තිබෙන හැකියාව අහිමිවී යනවා. සාමාන්‍ය පුද්ගලයෙකු ගේ අයිතිවාසිකම් උල්ලංඝණය වුනාම නීතිඥ සහය ලබාගැනීමට, මුදල් සොයා ගැනීමට, අදාළ ක්‍රියාවන් සඳහා යොමු වෙද්දි මේ මාසයක කාලය ඉක්මවා යා හැකියි. ඒ සහනය ලබාගැනීම සඳහා ඒ කාලය කිසිසේත්ම ප්‍රමාණවත් නැති නිසා මේ මසක කාලය අනිවාර්යයෙන්ම පුළුල් කරලා අවම වශයෙන් මාස තුනක්වත් ලබාදිය යුතුයි. අනික තමයි, මූලික අයිතිවාසිකම් සඳහා ශ්‍රේෂ්ඨාධිකරණයටම යොමු වීමට සිදුවීම, ප්‍රාදේශියව දුරබැහැර ඉන්න පුද්ගලයින්ට මෙය අසාධාරණයක් විය හැකියි. ශ්‍රේෂ්ඨාධිකරණයේ මූලික අයිතිවාසිකම් නඩුවක් ගොණු කිරීමේ ප්‍රතිපාදන සැලසීම තමයි ඒක අවසාන තීරණයක් වෙන්නේ. ඉක්මනින් නඩු තීන්දුවක් ලබාදීම තමයි එහි අරමුණ. මහාධිකරණයක නඩුවක් නම් නැවතත් අභියාචනය කරන්න පුළුවන්, එවිට නඩුව තවත් දිර්ඝ වෙනවා. ශ්‍රේෂ්ඨාධිකරණයකට නඩුවක් ලබාදීමේ අරමුණ තමයි ඉක්මනින්ම ඒ සහන ලබාදීම. එහෙත් ප්‍රායෝගික ගැටළු මතුවෙනවා ඈත ප්‍රදේශයක ඉන්න පුද්ගලයෙකුට මේ ක්‍රියාමාර්ග යට ඇතුළු වෙන්න පුළුවන්ද කියලා. මේ ප්‍රායෝගික තත්ත්වයත් යම්කිසි ආකාරයක අවධානයට ගත යුතුයි.

රාජ්‍ය අංශයේ මැදිහත් වීමෙන් මානව හිමිකම් කොමිසම හෝ යම්කිසි රාජ්‍ය ආයතනයක් හරහා ජනතාවගේ මූලික අයිතිවාසිකම් වෙනුවෙන් නොමිලේ පෙනී සිටීම වැනි නීතිමය ආධාර ක්‍රමයක් ක්‍රියාත්මක වෙනවානම් පෙර කී දුර්වලතාවන් මඟහරවා ගන්න පුළුවන්. මොකද නීතිඥ සහය ලබා ගැනීම වැනි කාර්යයන්වලදී සාමාන්‍ය පුද්ගලයෙකුට අපහසුතාවක් ඇතිවෙන්න පුළුවන්. ඒ නිසා එය මගහරවා ගැනීමට ජනතාවට නොමිලේ නීති ආධාර ලබාදීම, අවම වශයෙන් මානව හිමිකම් උල්ලංඝණය වීම්වලටවත් නොමිලේ සහනයක් ලබාදෙන්න පුළුවන් නම් ඒක ජනතාවට සහනයක්.

**සාකච්ඡා කළේ :**
**මාධ්‍යවේදිනී මෙලනි මානෙල් පෙරේරා**

# ශ්‍රී ලංකාවට නව ව්‍යවස්ථාවක් සඳහා ශ්‍රී ලංකා ජාතික ක්‍රිස්තියානි මණ්ඩලය යෝජනා ඉදිරිපත් කරන ලදි



**2016.03.18 වන දින ශ්‍රී ලංකා ජාතික ක්‍රිස්තියානි මණ්ඩලයේදී ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණය පිළිබඳ මහජන අදහස් විමසීමේ කමිටුවේ සභාපති අධිනීතිඥ ලාල් විජේනායක මහතා වෙත යෝජනාවලිය පිළිගන්වන ලදි.**

- යෝජනාවලියේ හැඳින්වීමේදී ප්‍රජාතන්ත්‍රවාදය, නීතියේ ආධිපත්‍යය හා ජනතා අයිතීන්වලට ලැබිය යුතු සැලකිල්ල ලබාදෙමින් උපරිම ජනතා සහභාගිත්වයකින් ජනතාවාදි ව්‍යවස්ථාවක් සකසා ගැනීමේ අවශ්‍යතාවය මතුකර තිබුණි.

- තවද සිංහල, දෙමළ, මුස්ලිම් ජනතාවගේ සමාජ-ආර්ථික සංවර්ධනය ඉදිරියට ගෙන යා හැකි, සවිබල ගැන්විය හැකි සුරක්ෂිත හා අර්ථාන්විත බලය බෙදාගැනීමක් සම්බන්ධයෙන් අදහස් ඉදිරිපත් කර තිබුණි.

- ඡන්ද ක්‍රමය ගැන සඳහන් කිරීමේදී මිශ්‍ර නියෝජන ක්‍රමයේ ක්‍රමයක් සම්බන්ධයෙන් යෝජනා ඉදිරිපත් කර තිබුණි.

- මූලික අයිතිවාසිකම් සම්බන්ධයෙන් අදහස් දක්වීමේදී 'මූලික අයිතිවාසිකම් ඉල්ලුම් පත්‍රය' ප්‍රාදේශීය මහාධිකරණයකදී ගොනු කිරීමේ අයිතිය සකසා දීම සඳහා වූ ප්‍රතිපාදන ඇතුළත් කිරීමට යෝජනා කර ඇත. තවද අධ්‍යාපනයට ඇති අයිතිය, සාමකාමී පරිසරයක ජීවත් වීමේ ඇති අයිතිය, සෞඛ්‍ය සේවාවට ඇති අයිතිය, මූලික අයිතිවාසිකම් තත්ත්වයට ආරෝපණය කිරීමටද යෝජනා කර තිබුණි.

**සමස්ත යෝජනාවලිය තුළ හැඳින්වීම, රජයේ ස්වභාවය, රජයේ ස්වරූපය, ඡන්ද ක්‍රම ප්‍රතිසංස්කරණය, මූලික අයිතිවාසිකම් ව්‍යාප්ත කිරීම සහ රාජ්‍ය ප්‍රතිපත්ති සඳහා නියෝග දීම, දූෂණයට එරෙහි කොමිෂන් සභා සහ පරිපූර්ණ නීතිය සඳහා වූ අවශ්‍යතාවය, ව්‍යවස්ථානුකූල සභාව, නීති අධිකරණීයව සමාලෝචනය කිරීම සඳහා වූ අයිතිය, ආගමේ කාර්ය තත්ත්වය යන ශීර්ෂ යටතේ සවිස්තරාත්මකව සිය අදහස් හා යෝජනා ඉදිරිපත් කර තිබුණි.**



ශ්‍රී ලංකා ජාතික ක්‍රිස්තියානි මණ්ඩලය විසින් අංක 510, රාජගිරිය පාර, රාජගිරියේ පිහිටි K.S.U. ග්‍රැෆික් පෞද්ගලික සමාගමේ මුද්‍රණාලයේ මුද්‍රණය කර ප්‍රසිද්ධ කරන ලදි.

# අවධානයට

ජාතික ක්‍රිස්තියානි මණ්ඩලය, නො. 368/6, බෞද්ධාලෝක මාවත, කොළඹ 07




# බලය විමධ්‍යගත කරලා
## ජනතාවට වැඩි බලයක් හිමිවන පාලන ක්‍රමයක් ඇති කළ යුතුයි

**1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ආරම්භයේම තිබූ දුර්වලතාවය ජේ. ආර්. ජයවර්ධනගේ පෞද්ගලික අභිලාෂයන් මත ගොඩ නැගුණු ව්‍යවස්ථාවක් වුණා. මේක හදන්න පෙර මහජන අදහස් මතය විමසුවේ නැහැ. මහජන කතිකාවතක් ගොඩ නැගුණේ නැහැ.**

**ව්‍යවස්ථාදායක සභාව තමයි සියලුම පත් කිරීම් කරන්නේ. අධිකරණය වේවා රාජ්‍ය අංශයේ ඉහළම තනතුරු යෝජනා, සම්මත කරන්නේ එයයි. මෙහිදී අදේශපාලනික පුද්ගලයන් පත් වෙනවා නම් ඒක වඩාත් යහපත් ප්‍රවණතාවක් වෙයි.**

**පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමයක් ගත් විට මහජන නියෝජිතයන් හැම වෙලේම ජනතාවට වග කියනවා. අපි දැකපු අත්දැකීම තුළ එම වග කියන භාවය අඩු බවක් දක්නට ලැබුණා. නව ආණ්ඩුක්‍රමයක රාජ්‍ය පාලනය ජනතාවට වග කියන එකක් විය යුතු යි.**



මිගාර ඩොස් - නීතිඥ

**දැනට පවතින ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සහ අලුතින් සම්පාදනය කරන්නට යන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පිළිබඳව ඔබගේ අදහස් කවරේද?**

දැනට පවතින ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළ දකින්නට ලැබෙන දුර්වලතා පිළිබඳව කථා කිරීමෙදි - 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ආරම්භයේම තිබූ දුර්වලතාවය ජේ. ආර්. ජයවර්ධනගේ පෞද්ගලික අභිලාෂයන් මත ගොඩ නැගුණු ව්‍යවස්ථාවක් වුණා. මේක හදන්න පෙර මහජන අදහස් මතය විමසුවේ නැහැ. මහජන කතිකාවතක් ගොඩ නැගුණේ නැහැ. හුදෙක් පුද්ගලයෙක් හා ඔහුගේ දේශපාලන පක්ෂයක අභිමතාර්ථයන් තමයි ඉන් නිරූපණය වුණේ. එහි දී රාජ්‍ය බලය එක් පුද්ගලයෙක් හා ආයතනයක් වටා කේන්ද්‍රගත වීම. නමුත් විධායක ජනාධිපති ධූරය හඳුන්වා දීමෙන් රටේ ලොකු සංවර්ධයක් ඇති කළ හැකියි. ඒ රටේ ජනවාර්ගික ප්‍රශ්නය ඉතා දක්ෂ ලෙස හැසිරවීම හා විසඳුමක් දීමේ පොරොන්දුව හා අදහස මත තමයි මේ 78 ව්‍යවස්ථාව ගොඩ නැගුනේ. එහි ඇත්තම අත්දැකීම විමසා බැලුවොත් සංවර්ධනයක් කරන්න උත්සාහ කිරීමේදී ඉතා විශාල ශ්‍රම සූරාකෑමක් ජනතාවට අත්දකින්නට ලැබුණා. නිදහස් වෙළඳ කලාප බිහි වුණා. ඒවායින් රැකියා ලැබුණා. විවෘත ආර්ථික ක්‍රියා පිළිවෙත යටතේ වැඩි වශයෙන් සූරා කෑමට ලක්වුණා. දීර්ග වශයෙන් වැඩ කිරීම, අයිතිවාසිකම් කප්පාදු කිරීම, ඒවා වෙනුවෙන් හඬ නැගූ හැම මර්දනය කිරීම් සිදුවුණා. 78ත් මෑතක දී මහින්ද රාජපක්ෂ පාලනයේ දීත් මේ වගේ යි. රාජ්‍ය බලය සඳහා තම අයිතීන් වෙනුවෙන් කථා කරන සේවකයන්ව මර්දනය කරනවා. එහෙම කරන්න අවස්ථාව තියෙන්නේ මේ ආණ්ඩුක්‍රමය තුළ එක් ආයතනයකට ලබා දී තිබෙන බලය නිසා.

අනිත් පැත්තෙන් ජනවාර්ගික අර්බුදයට විසඳුමක් ගේන්න විධායක ජනාධිපති ක්‍රමයට හැකි වෙනවා යන පොරොන්දුව 78 ලබා දුන්නට අපි අත්වින්ඳා සිදු වූ දෙය.

**නියපොත්තෙන් කපන්න තිබූ දෙය පොරවෙන් කපන්න තරම් තත්ත්වය දරුණු වුණා.** අද ආණ්ඩුක්‍රමයේ ලොකුම දුර්වලතාවය විධායක ජනාධිපති ක්‍රමයයි. කේන්ද්‍ර ගත වූ බලය නැවත විමධ්‍ය ගත කිරීම තමයි මේ සඳහා ගත හැකි එකම ක්‍රියා මාර්ගය. එය කළ යුතු ආකාරය නැත්නම් විධායක ජනාධිපති ධූරය නාමික ජනාධිපති ධූරයක් කරනවාද නැත්නම් එහෙමම තියලා ව්‍යවස්ථාදායක සභාව හෝ පාර්ලිමේන්තුව ද්වීමණ්ඩල සභාවක් කරලා බලය සීමා කරනවාද කියන කතිකාවත තමයි දැන් තියෙන්නේ. බලය විමධ්‍ය ගත කරලා ජනතාවට වැඩි බලයක් හිමිවන පාලන ක්‍රමයක් ඇති කළ යුතු යි. මූලික දුර්වලතාවය එයයි. අධිකරණය තවත් ස්වාධීන විය යුතු යි. විශේෂයෙන් ම උපරිමාධිකරණ විනිසුරුවන් පත් කිරීම වගේ දේවල් විනිවිදභාවය ස්වාධීනත්වය ආරක්ෂා වන ආකාරයේ ක්‍රියා මාර්ග ගත යුතු යි. දැනට තිබෙනවා ව්‍යවස්ථාදායක සභාව තුළින් සිදු වීමට පුළුවන්. හැබැයි ඒකෙ ගැටලුවක් මතු වන්නේ ව්‍යවස්ථාදායක සභාවට බහුතරයක් ඉන්නේ පාර්ලිමෙන්තු මන්ත්‍රීවරු. ඔවුන්ට ඒ පක්ෂයක නායකයාට අගමැතිවරයාට හතුරුවන්න පුළුවන් ද කියන කාරණය නැවතත් මතු වෙනවා. මේ ව්‍යවස්ථාදායක සභාව තමයි සියලුම පත් කිරීම් කරන්නේ. අධිකරණය වේවා රාජ්‍ය අංශයේ ඉහළම තනතුරු යෝජනා, සම්මත කරන්නේ එයයි. මෙහිදී අදේශපාලනික පුද්ගලයන් පත් වෙනවා නම් ඒක වඩාත් යහපත් ප්‍රවණතාවක් වෙයි.

### නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළ රාජ්‍ය පාලනය කෙබඳු ආකාරයකට සකස් විය යුතු යැයි ඔබ සිතනවාද?

1978 සිට අපි අත්දැකපු රාජ්‍ය පාලනය ජනතාවගෙන් ඈත් වුණු එක් දේශපාලන බලාධිකාරයක් මත ගොඩනැගුණු එකක්. මොන පක්ෂය ආවත් එහි නායකයා විධායක ජනාධිපතිවරයා හෝ ජනාධිපතිවරිය වෙනවා නම් ඒ පුද්ගලයා කේන්ද්‍රීයව තමයි පාලන තන්ත්‍රය ගොඩ නැගුණේ, නැතුව මහජන කේන්ද්‍රීයව නොවෙයි.

**පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමයක් ගත් විට මහජන නියෝජිතයන් හැම වෙලේම ජනතාවට වග කියනවා. අපි දැකපු අත්දැකීම තුළ එම වගකියන භාවය අඩු බවක් දක්නට ලැබුණා. නව ආණ්ඩුක්‍රමයක රාජ්‍ය පාලනය ජනතාවට වග කියන එකක්** විය යුතු යි. විධායකය, ව්‍යවස්ථාදායකය, අධිකරණය යන ආයතන තුන එකිනෙකට ස්වාධීනව කටයුතු කරන තත්ත්වයක් අවශ්‍ය වෙනවා. අපේ අත්දැකීම මෙතෙක් කල් අධිකරණයේ විනිසුරුවරයා පත් කිරීමේ දී ජනාධිපතිවරයාට හා රජයට ලොකු බලයක් තියෙනවා. අදටත් එහෙමයි. එහෙම නැතුව ශ්‍රේෂ්ඨත්වය හා කාර්ය සාධනය මත අධිකරණ නිලධාරීන් පත් කිරීමේ ක්‍රියාවලිය සිදු වෙනවා නම් අධිකරණය ස්වාධීනව කටයුතු කිරීමට හැකි වනවා නම් හොඳයි. විධායකයට ඇති බලය අපිට සීමා කළ හැකි නම් පාලනයකට ලක්කිරීමේ ක්‍රියාවලියක් ගොඩනැගෙනවා නම් නිදසුනක් ලෙස ඇමෙරිකාවේ විධායක ජනාධිපති ධූරයක් තිබුණාට ජනාධිපතිවරයාට තනි තීරණ ගන්න බැහැ. සැම විටම කොන්ග්‍රස් මණ්ඩලයෙන් හා සෙනෙට් සභාවෙන් සම්මත විය යුතු යි. ජනපති බලතල සිමාවකට හා පාලනයකට ලක් වෙනවා. එවැනි ක්‍රමවේදයක් අපේ නව පාලන තන්ත්‍රයක් තුළින් දකින්ට ලැබෙනවා නම් නැවතත් ජනතාවගෙන් පත්වෙන නියෝජිතයන්ට වැඩි බලයක් ලැබෙනවා විධායක බලය පාලනය කිරීම සඳහා. වඩා ජනතාව සහභාගි කරවන පාලන බිහි වෙනවා නම් ඒක රටට සුභදායී වෙනවා. අපි ඒ සඳහා ප්‍රතිපාදන සැලසීමටත් යෝජනා කරනවා.

### නව ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා සංශෝධනය තුළ සුළු ජාතීන්ගේ අයිතිවාසිකම් තහවුරු කර ගැනීමට කළ යුත්තේ කුමක්ද?

නව ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා සංශෝධනයක් හරහා දේශීය වශයෙනුත් ජනවාර්ගික අර්බුදයට විසඳුමක් සෙවිමේ ව්‍යායාමයට අප රට තල්ලු වී තිබෙනවා. නව ආණ්ඩු ක්‍රමයක් ගොඩනැගීමේදී මෙය වැදගත්. දැන් අපේ රටේ තිබෙන්නේ 1987දී අපි උත්සාහ කළ පළාත් සභා ක්‍රමය. ඒ ක්‍රමය සාර්ථක ද අසාර්ථක ද යන්න සෙවීමේ දී එය හඳුන්වා දුන්නේ ම ජනවාර්ගික අර්බුදයට විසඳුමක් ලෙසයි. උතුරු නැගෙනහිර ජනතාව ගේ ස්වයං නිර්ණය අයිතිය තහවුරු කිරීම, ඔවුනගේ අයිතීන් තහවුරු කිරීමේ දී විසඳුමක් ලෙසයි. හැබැයි අවාසනාවට මේක ක්‍රියාත්මක වීම ඇරඹුණේ ඉතාමත් මෑත කාලයේ දී යි. ඒ උදාහරණය ම ඇති අපිට පළාත් සභා ක්‍රමය ජනවාර්ගික අර්බුදය විසඳීමට ප්‍රමාණවත් ද යන්න සොයා බැලීමට. මුහුණතින් පෙනෙන පරිදි එය අසාර්ථකයි. අපි මේකට විසඳුමක් සෙවිය යුතුයි. එහිදී මේ රටේ පාලන තන්ත්‍රය දැනට තිබෙන පළාත් සභා ක්‍රමයෙන් ඔබ්බට යනවාද ඒක ස්ථාපනය කරනවාද ඊට අඩු ප්‍රාදේශීය පාලන තන්ත්‍රයක් ගොඩනගනවාද යන්න ගැන අපි අවධානය යොමු කළ යුතු යි. මේ අවස්ථාවේ දී උතුරේ ජන නියෝජිතයන් ෆෙඩරල් විසඳුමක් ඉල්ලා සිටිනවා. දකුණේ ජනතාවට ඒ ගැන ලොකු අවබෝධයක් නැති තත්ත්වයක් තමයි දකින්නට ලැබෙන්නේ. ෆෙඩරල් කියන්නේ මොකක්ද කියන කාරණාව, ඇයි එය අවශ්‍ය යන්න ගැන දැඩි අනවබෝධයක් තමයි දකින්නට ඇත්තේ. ලංකාවේ ඉතිහාසය ගත් විට දෙමළ ජනතාව දිගින් දිගටම අරගල කළා. ඒ සෑම අවස්ථාවකදීම රැවටීම සහ අවිශ්වාසය තමයි ඔවුන්ට ඉතුරු වුණේ. පළාත් සභා ක්‍රමයෙන් ඔබ්බට යන ජනතාවට තම පාලනය ගැන තීරණය කළ හැකි මූල්‍ය බලතල, ඉඩම් බලතල, පොලිස් බලතල ලැබෙන ක්‍රමයක් කරා අපි යා යුතු වෙනවා.

නමුත් ෆෙඩරල් ක්‍රමයක් යෝජනා වෙලා තියෙන නිසා නැවතත් අපිට ප්‍රශ්නයක් එනවා උතුරේ ජනතාව වෙනුවෙන් ඉල්ලා සිටින මේ ෆෙඩරල් ක්‍රමය වෙනුවෙන් ඒ ජනයාට අවබෝධයක් තිබේද යන්න කියා. ජනතාවට ඒ අවශ්‍යතාවය තියේද කියා? අනික ඒ බලතල ලබා දී ඔවුන්ට අවශ්‍ය සේවය කළ



**මේ රටේ පාලන තන්ත්‍රය දැනට තිබෙන පළාත් සභා ක්‍රමයෙන් ඔබ්බට යනවාද ඒක ස්ථාපනය කරනවාද ඊට අඩු ප්‍රාදේශීය පාලන තන්ත්‍රයක් ගොඩනගනවාද යන්න ගැන අපි අවධානය යොමු කළ යුතු යි. මේ අවස්ථාවේ දී උතුරේ ජන නියෝජිතයන් ෆෙඩරල් විසඳුමක් ඉල්ලා සිටිනවා. දකුණේ ජනතාවට ඒ ගැන ලොකු අවබෝධයක් නැති තත්ත්වයක් තමයි දකින්නට ලැබෙන්නේ. ෆෙඩරල් කියන්නේ මොකක්ද කියන කාරණාව, ඇයි එය අවශ්‍ය යන්න ගැන දැඩි අනවබෝධයක් තමයි දකින්නට ඇත්තේ. ලංකාවේ ඉතිහාසය ගත් විට දෙමළ ජනතාව දිගින් දිගටම අරගල කළා. ඒ සෑම අවස්ථාවකදීම රැවටීම සහ අවිශ්වාසය තමයි ඔවුන්ට ඉතුරු වුණේ. පළාත් සභා ක්‍රමයෙන් ඔබ්බට යන ජනතාවට තම පාලනය ගැන තීරණය කළ හැකි මූල්‍ය බලතල, ඉඩම් බලතල, පොලිස් බලතල ලැබෙන ක්‍රමයක් කරා අපි යා යුතු වෙනවා.**

හැකි ද? මතුවන ප්‍රධාන ප්‍රශ්න තමයි උතුරු පළාත් සභාව ගත් විට රජය හරහා විශාල ප්‍රතිපාදන ඒ ප්‍රදේශවලට ලැබිලා තිබෙනවා. ප්‍රතිපාදන මත උතුරු පළාත් සභාව ප්‍රමාණවත් සේවයක් කර තිබෙනවාද? බොහෝ මාධ්‍යවේදීන් හා උතුරේ ජනතාව මත ප්‍රකාශකර තිබෙනවා මේ සේවය ගැන සෑහීමකට පත් වෙන්න බැහැ කියලා. තමන්ට තිබෙන ප්‍රතිපාදන තුළත් සේවය කරන්න බැරි තත්ත්වයත් තුළ ඒ ෆෙඩරල් ක්‍රමය මගින් ජනතාවට සෙත සැලසේද යන්න සිතා බැලිය යුතු යි. අනිවාර්යෙන් දෙමළ ප්‍රශන්යට විසඳුමක් ලැබිය යුතු යි. හැබැයි ඊට දකුණේ මෙන්ම උතුරේ අන්තවාදයත් උතුරේ ජනනායකයන්ගේ අකාර්යක්ෂමතාවයත් මීට බලපා තිබෙනවා. මූලිකවම උතුරු නැගෙහිර ජනයාගේ අයිතිවාසිකම් ඔවුන් මේ රටේ හුන් ප්‍රෞඪ ජාතියක්. ඔවුන්ගේ අහිමි වූ ආත්ම ගෞරවය අභිමානය නැවත ස්ථාපනය කළ යුතු යි. අපිට විකල්ප තිබෙනවා පළාත් සභා ක්‍රමයට ඉන් ඔබ්බට යන බලය බෙදීමක් කිරීම නැත්නම් ෆෙඩරල් ක්‍රමයක් කරා යාම.

මතවාදී ලෙස උතුරේ මෙන්ම දකුණේද ඔළුගෙඩි සකස් කළ යුතුයි. උතුරේ නායකයන් මේ ගැන ඔවුන් දැනුවත් කරනවාද යන්න පෙනෙන්නට නැහැ. ඒ ගැන පක්ෂ අභ්‍යන්තරයේ හා පක්ෂ අතර කඹ ඇදීමක් තමයි දක්නට තියෙන්නේ. ඉන් ඔබ්බට ගොස් ජනතාව සහභාගි කරවන ව්‍යාපාරයක් වේ නම් වඩාත් සාර්ථක විය හැකියි.

## මානව හිමිකම් ක්ෂේත්‍රය පුළුල් කිරීමට නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය තුළ ඇතුළත් කළ හැකි ප්‍රතිපාදන කවරේද?

**නව රජය පත් වීමේදී ජනවරම ඉල්ලා සිටියේ යහපාලනයක් උදෙසායි. ප්‍රජාතන්ත්‍රවාදය, ජනතා සහභාගීත්වය, මානව හිමිකම් ස්ථාපනය වන පාලන තන්ත්‍රයක්. ඒකට ඔවුන් දින සීයේ සැලැස්ම වැනි දේවල් ඉදිරිපත් කර තිබුණා. ඊට අමතරව මානව හිමිකම් හා ප්‍රජාතන්ත්‍රවාදයට අත්‍යවශ්‍ය නීති කිහිපයක් සම්මත කරනවා කියලා කිව්වා. එකක් තමයි පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට විනය මාලාවක්. අනික තොරතුරු දැනගැනීමේ අයිතිය. එනම් යම් රාජ්‍ය දෙපාර්තමේන්තුවක, ආයතනයක සිදු වන්නා වූ කිසියම් ක්‍රියාකාරකමක් මුදල් ප්‍රතිපාදන වෙන් කිරීමක් ටෙන්ඩර් කැඳවීමකදී ඕනෑම දෙයක් ගැන සාමාන්‍ය** ජනතාවට තොරතුරු ඉල්ලලා යම් කිසි කාලසීමාවක් තුළ ඒවා ලබා දීමට බැඳී සිටින ක්‍රියාවලියක්. දකුණු ආසියාවේ බොහෝ රටවල මේක තිබෙනවා. පකිස්තානයේ, ඉන්දියාවේ වගේම අපිට වඩා අන්ත රටවලත් මෙය ස්ථාපනය කර තිබෙනවා. ඉන්දියාවේ ඉතාමත් සක්‍රීයයි. එහි සිවිල් සමාජය තමයි මේක හඳුන්වාදීමට ප්‍රමුඛතාවය ගනු ලැබුවේ. යම්කිසි සීමා පැනවීම් තිබුණත් යම් කිසි ආයතන ව්‍යුහයක් තිබෙනවා. මේකත් දින සීයේ පොරොන්දු වුණා හැබැයි අවාසනාවකට වගේ සිදු වුණේ නැහැ. යහපත් ආණ්ඩු කරණයක් ගොඩනැගීමට නම් පොරොන්දු වුණ විනය මාලාවක් අවශ්‍ය වෙනවා පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට. අනෙත් පසින් ඉතාමත් සාධනීය වනවා තොරතුරු දැන ගැනීමේ අයිතිය වැනි දෙයක් හඳුන්වා දීම තුළ. විනිවිදභාවය මගින් පාලකයන් ජනතාවට වගකියන ව්‍යුහයක් ගොඩනැගීමට උදව් වනවා. තවත් කාරණයක් තමයි නව රජය පත් වෙද්දිම ජනතාවට කිව්වා අල්ලස් හා දූෂණ වැහි වැහැලා තිබෙනවා, ඒක පාලනය කළ යුතුයි, දූෂිත පාලකයන් ගෙදර යැවිය යුතු යි කියන කාරණය. ඒකට මේ අල්ලස් හා දූෂණ කොමිසම ඒ නීතිමය පද්ධතිය ප්‍රමාණවත් ද කියන ප්‍රශ්නය එනවා. මෑතක දී රේගුවේ අල්ලස් ලබා ග ැනීමේ සිද්ධියක් පිළිබඳ ප්‍රවෘත්තිය. එය වැටලීමට අල්ලස් කොමිසමට ඉඩම් උකස් කරලා බැංකු ණයක් ලබා ගන්න සිදු වුණා. එක අල්ලසක වටිනාකම තරම් වත් වත්කම් අල්ලස් කොමිසමට නැහැ. ලංකාවේ අල්ලස් දූෂණ මැඩලන යාන්ත්‍රණයේ තිබෙන්නා වූ සීමාවන්. කොච්චර වත්කම් ප්‍රතිපාදන දීලා තිබෙනවා ද ඒවා ප්‍රමාණවත් නැද්ද යන කාරණය. අපේ අසල් වැසි රට



මූලික අයිතින් අපේ ආණ්ඩුක්‍රමයේ සුවිශේෂී අංගයක් වෙනවා. ජනතාවගේ මූලික අයතිවාසිකම් උල්ලංඝණය වේ නම් අධිකරණ ක්‍රියාවලියක් හරහා ඉතාම ඉක්මනින් ඒවා ස්ථාපනය කරගැනීමේ ප්‍රතිපාදන සලසා දී තිබෙනවා. එහි තිබෙන මූලික ගැටළුවක් තමයි විධායක හෝ පරිපාලන ක්‍රියාවක් මගින් තමන්ගේ මූලික අයිතින් උල්ලංඝණය වෙන අවස්ථාවකදී පමණයි ජනතාවට ඒ සහන ලබාගන්නට පුළුවන් වෙන්නේ. මේ තත්ත්වය පුළුල් කිරීමේ අවශ්‍යතාවයක් තිබෙනවා.

තමන්ගේ සේවා ස්ථානයේ දී හෝ පෞද්ගලික අංශයේ රැකියාවක් කරද්දී ඕනෑ තරම් අයිතිවාසිකම් උල්ලංංඝණය විය හැකියි. හැබැයි මේ හැම ක්ෂේත්‍රයක්ම ආවරණය කරන්නට මූලික අයිතිවාසිකම් ක්‍රියාත්මක කිරීමේදි ප්‍රායෝගික ගැටළු මතුවනවා. නමුත් ජනතාවගේ මූලික අයිතිවාසිකම් ස්ථාපනය කිරිම මීට වඩා පුළුල් කිරිම සඳහා ජාත්‍යන්තරයේ ක්‍රියාත්මක වන ආණ්ඩුක්‍රම මූලධර්මයන් මත මූලික අයිතිවාසිකම් පුළුල් කිරීමේ අවශ්‍යතාවක් මතුවී තිබෙනවා.

වන ඉන්දියාවේ අවුරුදු තුනකට පමණ පෙර සිවිල් සමාජය මැදිහත් වෙලා ජාන්ලෝග් පාල්ගේ කියලා අල්ලස් හා දූෂණ මැඩලීමේ පනතක් ගෙන ආවා. විශාල වශයෙන් ප්‍රතිපාදන සපයන විශාල ආයතනික ව්‍යුහයක් සකස් කරන්නා වූ නීතියක් හැදීමට රටේ සිවිල් අරගල පැවතුණා. ඊට මූලිකත්වය ගත්තේ අන්නා හසාරේ කියලා ඉන්දියානු සිවිල් දේශපාලන නායකයෙක්. විශාල රැල්ලක් ඇති වෙලා එහි ප්‍රතිඵලයක් ලෙස ප්‍රායෝගික නොවන තරමටම විශාල ආයතනික ව්‍යුහයක් බිහි වුණා. අද වන විට ඒ නීතිය ජාතික වශයෙන් සම්මත කරලා එහි තවත් ප්‍රතිපාදන ඇතුළුව දිල්ලි නගරයේ ප්‍රාන්ත රාජ්‍ය විසින් ක්‍රියාතක්මක කරලා තිබෙනවා. අපේ රටේත් සිවිල් ජනතාවට මේවා මැඩලීම සඳහා මතයක් ගොඩනැගීමේ වගකීම තිබෙනවා. **නව ව්‍යවස්ථාව තුළ අල්ලස් දූෂණ මැඩලීමේ නීතිමය රාමුවක් සකස් කරනවා නම් ඒක රටේ යහපාලනයට හුගක් උදව් වෙනවා. අද අල්ලස් කොමිසක් තියෙන්නේ කොළඹ විතරයි. ග්‍රාමීය ජනතාවටත් තමන් අත්දකින සිදුවීම් වාර්තා කරලා ඒවාට ක්‍රියාමාර්ග ගන්න පුළුවන් යාන්ත්‍රණයක් ගොඩනගනවා නම් ඒක යහපත් ආණ්ඩුකරණයට වැදගත් වනවා.**

## මූලික අයිතිවාසිකම් නඩු ඇසීම කොළඹ කේන්ද්‍ර කරගනිමින් සිදුවෙන්නේ. මේ තත්ත්වය වෙනස් කරගන්නට කළ යුත්තේ කුමක්ද?

මූලික අයිතින් අපේ ආණ්ඩුක්‍රමයේ සුවිශේෂී අංග යක් වෙනවා. ජනතාවගේ මූලික අයතිවාසිකම් උල්ලංඝණය වේ නම් අධිකරණ ක්‍රියාවලියක් හරහා ඉතාම ඉක්මනින් ඒවා ස්ථාපනය කරගැනීමේ ප්‍රතිපාදන සලසා දී තිබෙනවා. එහි තිබෙන මූලික ගැටළුවක් තමයි විධායක හෝ පරිපාලන ක්‍රියාවක් මගින් තමන්ගේ මූලික අයිතින් උල්ලංඝණය වෙන අවස්ථාවකදී පමණයි ජනතාවට ඒ සහන ලබාග න්නට පුළුවන් වෙන්නේ. මේ තත්ත්වය පුළුල් කිරීමේ